

සතුටු කඳුලු
වගීෂා නෙත්මිණී ජයරත්න

- **කෘතියේ නම :** සතුටු කඳුලු
- **කතෘ :** වගීෂා නෙත්මිණී ජයරත්න
- **වයස :** 13
- **ශ්‍රේණිය :** 8-B ශ්‍රේණිය
- **පාසල :** මහමායා බාලිකා විද්‍යාලය
- **කෘතිය එළි දැක්වූ දිනය :** 2024.02.22
- **ISBN :** 978-624-208-786-3

## පිදුම

මාගේ සෙවනැල්ල ලෙසින් නිරතුරුව මා අසළ රැදෙමින් මගේ සියලු වැඩ කටයුතු ඉටු කර දෙන මගේ ආදරණීය අම්මාටත්, කරදර කරමින් වුවද සහය වෙන අක්කාටත් සෑම විටක ම මගේ සියලු වැඩ කටයුතුවලට උදව් කරමින් මගේ යෝධ ශක්තිය වන තාත්තාටත්, මා උනන්දු කරමින් සහය දෙන මගේ මිතුරියන්ටත්, මගේ ආදරණීය ගුරුවරුන්ටත්, මෙම පොත කියවන පාඨක ඔබ සැමටත් ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල්පරිච්ඡේද නිසායි. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත අතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන **" හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයෙන් සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වේ. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හදිනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

1.

දෝනි මෙහාට එන්නකෝ... මම ඉක්මනට ගිහින් ඉක්මනට ම එන්නම්. ඔයා වගේ පුංචි ලමයි ගොඩක් බේර ගන්න ඕනි නේ, මම ඉක්මනට ම එන්නම්.

ඔයා පොරොන්දු වෙනවද?

හ්ම්, මම පොරොන්දු වෙනවා.

මම ගිහින් එන්නම් අම්මා

මම ගිහින් එන්නම් මදූ..

...

නිවස දෙසට පැමිණි යු.හ. යැයි නම කර තිබූ මෝටර් රතයට මැදි වියේ පිරිමියෙකු නැග රූමත් මැදි වියේ කාන්තාවකට, තවමත් කඳුලු සලමින් සිටිනා හුරුබුහුටි ගැහැනු ලමයෙකුට හා ශෝක බරිත දෙනෙතින් කාරය දෙස බලා සිටිනා මහලු වියට පය තැබූ කන්තාවකට අත වනමින් නොපෙනී යයි.

....................

හ්හ.. ආයෙමත් ඒ හිනෙ, මම වෛර කරන දේවල් ම හීනෙන් පේන්නෙ ඇයි මට..

........................

මම වෙලාව බැලුවෙමි. අයියෝ වෙලාව 4.00 නේ තවම මම හිතන් හිටියේ අද ටිකක් නිදා ගන්න. කමක් නෑ කිචන් එකට ගිහින් කොෆී එකක් බොනවා.

තවමත් ඇඳේ නිදමින් සිටි මගේ මිතුරිය දෙස බැලූ මම නැවතත් හැරී කිචන් එක වෙත ගියෙමි. හෙට දින උදෑසන 4.30 ට පමණ ඇ නැගිටින බව පැවසූ නිසා මම ඇයටත් කෝපි කෝප්පයක් සෑදුවෙමි.

දුඹුරු පාටින් දුම් දමන කෝපි කෝප්පය තුලින් මම කල්පනා ලොව තනි වුනෙමි.

....

එදා සිකුරාදා දවසක්. අපේ ඒලෙවල් විභාගයේ දෙවැනි දවස. විභාගය අවසන් වූ අප දෙදෙනා මග බලා සිටියේ මගේ හොදම මිතුරිය වූ දෙව්නිගේ පියා පැමිනෙණ තුරුය. අප පාසල් ගේට්ටුව වෙත පැමින විනාඩි දහයක් යන්නට මත්තෙන් දෙව්නිගේ පියාගේ කාරය ගේට්ටුව අසල නැවතුනි. ආ කවිත්මා දුවේ , දෙව්නි මොකෝ කොහොමද විභාගේ? අව්ලක් නෑ අන්කල්. මටත් ලේසි අප්පච්චි.

ආ ඒක නෙවෙයි දුව ඔයා අද අපේ ගෙදර යමු. එහෙම කොහොමද අප්පච්චි මදූ ආන්ටිගෙන් අහන්න එපැයි. නෑ දුව ආන්ටි තමයි කිවුවේ අද අපේ ගෙදර ඉදලා පාඩම් කරන්න කියලා.

ආ හරි අන්කල් එහෙනම් අපි යමු.

දෙව්නිගේ ගෙදර ගිය මම ඇයත් සමග පාඩම් කොට පසුදින උදෑසනම පාසලට ගියෙමී.

විභාගය අවසන් වූ පසු නැවතත් අපි කාරය එනතුරු බලා සිටියෙමු. මද වේලවකට පසු කරය අප දෙසට විත් නැවත්වීය.

හරි නගින්න පුතා අපි යමු ගෙදර. අපි තව ගමනකුත් ගිහින් යමුකෝ.

දෙව්නිගේ තාත්තා කාරය ජාතික රෝහල අසලින් නැවැත් වීය.

***

කවී ඔයා මොනවද කල්පනා කරන්නේ.

ඒ වදනින් මා නැවතත් පියවි සිහියට පැමිනියෙමි. ආ ගුඩ් මෝර්නින් දෙව්නි

ඔයා නගිට්ටද මම ඔයාට කොෆී එකක් හැදුවා මෙන්න බොන්න. මම එතකන් වොශ් එකක් දාගෙන එන්නම්.

"ආ හරි කවී". දෙව්නි පැවසුවේ කෝපි කෝප්පය අතට ගනිමිනි.

ම්ම්.. කෝෆී එක නම් රසයි. තැන්ක්ස් කවී.

ඉක්මනින් ම සෝදා ගෙන පැමිනි මම කැම්පස් යෑමට ලැස්ති වුනෙමි.

දෙව්නි ඔයා මොකද කරන්නෙ ඉක්මනට එන්න වෙලා යනවා.

"විනාඩි දෙකෙන් මන් ඔතන" දෙව්නි කලබලෙන් පැවසුවා ය.

***

ඉක්මනින් ලෑස්ති වුන අපි බස් රතයට නැගුනෙමු.

කවී මට නිදි මතයි මම ටිකක් නිදා ගන්නම් මට කැම්පස් එක ලගදි කතා කරන්න.

ආ හරි දෙව්නී.

***

ඇයට නිදන්නට දී මම අතීතාවර්ජනයට එලඹුනෙමී.

විභාගය අවසන් වූ දින දෙව්නිගේ පියා ජාතික රෝහල අසල කාරය නැවැත්වී ය.

ඔහු අපේ ආච්චි අම්මා  අසනීපවී රෝහල් ගත කල බව පැවසුවේ ය. එ වදන් මට ඇසුනේ සිහිනයකින් මෙනි. ආච්චි අම්මා අසනීප වී නිසා මා ඔවුන්ගේ නිවසේ රදවා ගත් බවත් අම්මා රෝහලේ නැවතී සිටින බවත් පැවසුවේ ය.

මා වේගයෙන් රෝහල වෙතට දිව ගියෙමි.

කවුන්ටර වෙත ගොස් තොරතුරු ඇසූ මම වේගයෙන් ඔවුන් සිටි කාමරයට ගියෙමී.

"ආ දෝණී ඔයා ආවද" එවදන් මාගේ අම්මාගේ ය.

අම්මි කොහොමද ආච්චි අම්මට දැන්. එයාට දැන් හොදයි පුතේ. ඩොක්ට එයාව ටෙස්ට් එක්කට අරන් ගියා. හෙට ආච්චි අම්මව ඩිස්චාර්ජ් කරනව කිවුවා. ඔයා බය වෙන්න එපා පුතේ.

අම්මි එතකොට ඔයාද විමලසිරි අන්කල්ට කිව්වේ මාව එහෙ නවත්ත ගන්න කියලා.

" නෑ පුතේ මම මේ කාරනාව කිව්ව ගමන් ම අන්කල් කිව්වා ගෙදර ආවොත් ඔයාට පාඩම් කරන්න බැරි වෙනවා, ඒ නිසා ඔයාව අපේ ගෙදර නවත්ව ගන්නම් කියලා මමත් ඉතින් කැමති වුණා පුතේ." අම්මා සෙමෙන් පැවසුවා ය.

කෙනෙක්ගේ එක පරිත්‍යාගයකට පුලුවන් තව කෙනෙක්ගේ ජීවිතය කනපිට පෙරලන්නඇත්තෙන් ම මම  ආච්චි අම්මගේ අසනීපය දැන ගත්තා නම් විභාගය නොලියනු ඇත. නැතහොත් ෆේල් වනු ඇත.

මම  අද යම් තැනක සිටීද එයට හේතුව බොහෝ පිරිසකගේ අනේක විද කැපකිරීම් ය.

ඒ අදුරු දින කිහිපය කෙමෙන් ගෙවී ගියේ ය. ආච්චි අම්මගේ අසනීපය ද සුව විය.

එක් දිනක අම්මා කෑගැසුවේ විභාග ප්‍රතිපල නිකුත් වී ඇති බව පවසාය.

***

වොන්ට් යූ ගෙට් ඔෆ් ද බස් මිස්. වී කේම් දි එන්ඩ් ඔෆ් ද ජර්නි.

ඔහ් එක්ස්ට්‍රීම්ලි සොරි වී විල් ගෙට් ඔෆ්.

මා කල්පනා කරමින් සිටි මොහොතේදී බස් රතය ගමනාන්තයට ම පැමිණ තිබුණි.

දෙව්නී නගිටින්නකෝ අපිට හෝල්ට් එක මිස් වෙලා. ඉක්මනට නැගිටින්න.

"කවී අපි කොහෙද මේ ඉන්නේ?" දෙව්නි ඇසුවේ ඉතා කලබලයෙනි.

සොරි දෙව්නි මම ජනේලයෙන් එලිය බලා ගෙන හිටියා ටිකකින් කන්ඩක්ටර් ඇවිත් මට කතා කරලා ඇහුවා බහින්නේ නැද්ද කියලා.

"හ්ම්ම් මමත් නියම මනුස්සයාට කිව්වෙ ඇහැරවන්න කියලා. දැන් ඉතින් ලෙච්චර්ස් ඉවර වෙලත් ඇති." දෙව්නි පැවසුවේ කේන්ති මුහුනක් ආරූඪ කර ගැනීමට උත්සහ දරමින්ය.

"හරි එහෙනම් අපි පික් මී එකක යමු. මම සල්ලි දෙන්නම්." එසේ පැවසූ මම යන්තමින් ඇග බේරා ගතිමි.

අවසානයේ විනාඩි දහයකට පමන පසු කැම්පස් එක වෙත ඒමට අපට හැකි විය. දේශන  ආරම්භ වී නොතිබුනු බැවින් මගේ නොසැලකිලිමත්කමින් පාඩුවක් නොවීය.

පන්ති කාමරය වෙත ගිය අපි කතා කරමින් සිටියෙමු.

එවිට ම වගේ ප්‍රොෆෙසර් ග්‍රේස් පැමින දේශනය ආරම්භ කලේ ය.

ප්‍රතමයෙන් ම ඔහු පැවසුවේ අප කාගේත් සිත් සතුටු කරවන ආරංචියකි, ඒ අපව ඉන්ටර්න්ශිප් සඳහා රුසියාවේ ප්‍රසිද්ධ රජයේ රෝහලකට අනිද්දා දින සිට යොමු කරන බවයි. එය ඇසූ මට සතුට නිම් හිම් නැති විය.

***

සියල්ල අවසන් වූ පසු අපි බෝඩිම වෙත පැමිනියෙමු. දෙව්නිට හදිසියේ ම ටවුන් එකට යෑමට සිදුවූ බැවින් මා බෝඩිමෙහි තනි විය. මා නැවතත් අතීතය සිහි කරන්නට වුනෙමි.

***

ඒලෙවල් විභාගයේ ප්‍රතිපල නිකුත් වී තිබුණි. මටත් දෙව්නිටත් ඒ තුනක් සමගින් දිස්ත්‍රික්කයේ ප්‍රතම සහ දෙවන ස්තාන ලැබී තිබුනි. අප සැමගේ සතුට කියා නිම කල නොහැකි විය.

දිස්ත්‍රික් ත්‍යාග ප්‍රදාන උත්සවයේ දී අප දෙදෙනාට සහ දිස්ත්‍රික්කයේ තුන්වෙනියාට රුසියාවේ ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලයකට ශිෂ්‍යත්වයක් ලැබුණි.

එදින මගේ ජීවිතයේ සතුටුදායක ම දිනය විය. කෙමෙන් කාලය ගෙවී යද්දි මමත් මගේ මිතුරියත් රුසියාවේ ඉතා සුන්දර නගරයක පිහිටි අපේ බෝඩිමේ නවාතැන් ගතිමු.

එක් පැත්තකින් මනරම් ජල කඳත්, අනෙක් පැත්තෙන් අලංකාර කඳු පෙළත්, ඈතින් අති නවීන ගොඩනැගිලිත් පෙනෙන සුවපහසු කාමරයක් අපට හිමි විය.

සෑම උදෑසනක ම හිරු උදාවත්, සවසක ම ඉර බැස යාමේ දර්ශනයත් අති මනරම් ලෙස පෙනෙන ජනේලය අසල හුරුබුහුටි ඇඳ මගේ කර ගැනීමේ වාසනාව මට හිමි වූයේ දෙව්නි සෑම දිනක ම පාහේ සෙම්ප්‍රතික්ෂා රෝගයෙන් පෙලෙන නිසයි.

අප නවාතැන් ගත් නිවස ඊට යාබද නිවසේ ජීවත් වූ සූරියබණ්ඩාර මහතාට සහ එම මැතිනියට අයත් වූවකි. අසල්වැසියන් සහ බෝඩිමේ අයිතිකරුවන් අපේ ම ශ්‍රී ලාංකිකයන් වූ නිසා මගේ ම ගෙදර වාගේ නොවුනත් බෝඩිම සිතට සහනදායී ස්තානයක් විය. දෙව්නි ද මා සමග සිටින බැවින් මගේ සියලු කටයුතු පිළිවෙලට කර ගැනීමට මට හැකි විය. දෙව්නි වැනි මිතුරියක් මගේ ලග සිටීම මගේ පෙර කල පිනක් වැනි විය.

මෙහි පැමිණි දින පටන් සෑම දිනක් ම සතුටත් දුකත් මුසුව ගෙවුණි. අම්මාගෙනුත් ආච්චි අම්මාගෙනුත් වෙන් වී සිටීම දුකක් වුවත් නව අද්දැකීම් සහිතව මව් රටින් පිටත සයුරු තෙරෙන් එහා අලුත් රටක ජීවත් වීම සතුටට හේතුවක් විය.

අනිද්දා දින සිට මගේ ජීවිත පොතේ නව බලාපොරොත්තු සහිත පිටුවක් පෙරලීමට නියමිතය. එතැන් සිට මගේ හීන සාර්තක කර ගෙන මගේ අම්මාගේත් බලාපොරොත්තු ඉෂ්ට කිරීම මගේ එකම සතුටයි.

***

කල්පනා කරමින් සිටි මට එතැන ම නින්ද ගොස් තිබුණි.

එක්වර ම ඇසුනු ශබ්දය නිසා මම තිගැස්සී නැගිට්ටෙමි.

"ඔහ්, මයි ගෝඩ්. අයි රියලි ෆොගොට් අබවුට් ඉට්. ඉට්ස් මයි බර්ත්ඩේ. තැන්ක් යූ වෙරි මච් දෙව්නි." මම පැවසුවේ පුදුම වෙමිනි.

එදින මාගේ උපන්දිනය විය. දෙව්නි කාටත් හොරෙන් නගරයට ගොස් තිබුනේ මා වෙනුවෙන් උපන්දින සාදයක් සැලසුම් කිරීමටයි.

අපගේ පුංචි සාදයේ තනිකම මැකීමටත් එහි සතුට වැඩි කිරීමටත් සූරියබණ්ඩාර දෙපළ අප හා එක් විය.

දෙව්නිගේ බලවත් ඉල්ලීම මත අම්මාත් ආච්චි අම්මාත් උදෑසන සිට ම මා හා කතා නොකල අතර සාදය අතරතුර ඔවුන් ද දුරකතනය ඔස්සේ අප හා එක් විය. දෙව්නිගෙන් ලැබුනු හුරුබුහුටි ටෙඩී බෙයාර්ව තුරුලු කර ගත් මම එදින නින්දට ගියේ මහත් වූ සතුටකිනි. එම සතුට වැඩි වේලාවක් නොතිබුනේ මගේ මතකය තාත්තා වෙත දිවගිය නිසයි.

***

දියතලාව කියන්නේ සුන්දරත්වයට හා ආදරයට අධිපති ග්‍රීක දෙවගන ඇෆ්‍රොඩයිට්ගේ ආශිර්වාදය නොඅඩුව ලැබුනු සුන්දරත්වයෙන් අග තැන්පත් නගරයක්.

මීදුම් සලු පටල අතරින් විරාජමානව සිටින මාහා කඳු පෙලත්, ෆයිනස් තුරු ගොමුවත් සීතල දිය දහරාත්, සීතලට මල් පැලදි තුරු ගොමුත්, ඉවර නොවෙන කඳු පල්ලන්වලිනුත් සුසැදි මේ පුංචි නගරයේ හමුදා කඳවුරට ඉතා ආසන්නයේ අලංකාර හුරුබුහුටි නිවසක ජීවත් වීමට ලැබීමට තරම් මා

වාසනාවන්ත විය.

ඒ මගේ  ජීවිතයේ ස්වර්ණමය යුගය විය. තාත්තාත්, අම්මාත්, ආච්චි අම්මාත් සමග ඒ ගෙවූ ආදරණීය වසර කිහිපය සදා මගේ මතකයේ රන් අකුරින් ලියැවී තිබෙනු ඇත.

මගේ තාත්තා යුධ හමුදාවේ අන දෙන නිලධාරීවරයෙක් විය. ඔහු අපේ නිවස අසලම පිහිටි දියතලාව හමුදා කඳවුරේ සේවා නියුක්තිකයෙකු විය.

ඉතා දක්ෂ සහ නිර්භීත සෙබලෙකු ලෙස ඔහු කා අතරත් ප්‍රසිද්ධව සිටි අයෙකි.

ඒ අඳුරු දිනය උදා වන විට මම හතර වසරේ ඉගෙනුම ලබමින් සිටියෙමි. දිනක් මහා රාත්‍රියේ තාත්තාට ඇමතුමක් ලැබුනේ හමුදා නිලදාරීවරයෙකුගෙනි. ඔහු කියා සිටියේ රුසියාවේ ප්‍රධාන නගරයක සිදු වන යුධමය තත්වය නවතාලීමට ශ්‍රී ලංකාවෙන් සෙබලුන් සීයයක් පමණ  ඉල්ලා ඇති බවත් ඒ සඳහා නායකත්ව දීමට තාත්තා තෝරා ගෙන ඇති බවත් ය.

පසුදින උදෑසන ම තාත්තා රුසියාව බලා පිටත් විය. ඒ මා ඔහුව දුටුව අවසාන දිනයයි.

එතැනින් පසුව ඔහු ඇතුලු කණ්ඩායම අතුරුදහන් වී ඇති බව පත්තරවල ප්‍රවෘත්ති පල විය. අම්මාත්, ආච්චි අම්මාත් සෑම විටක ම පාහේ අඬන්නට විය. එතැන් පටන් අද වන තුරු ඔහු පිළිබඳව කිසිදු තොරතුරක් නොවීය.

නමුත් කවුරුන් වුවද ඔහු මිය ගිය බව පැවසුවද මා මෙතෙක් කලක් එය විශ්වාස නොකලෙමි.

සෝ සුසුම් හා කඳුලු බිඳු මතින් දෑස් නින්ද සෙව්වත් නිදි දෙව්දුව මා සොයා ආවේ පාන්දර වන විටය.

***

කවී… කවී…. නැගිටින්නේ නැද්ද අද බඩු ටිකක් ගන්න ටවුන් යන්න ඕනි. ඉක්මනට නැගිටින්නකෝ.

"ඕකේ අයි විල් ගෙට් අප්. ප්ලීස් ගිව් මී ටූ මිනිට්ස්." එසේ පැවසූ මම ඉක්මනින් ම  අවදි වී ලෑස්ති වුණෙමි. ඒ වන විට ද දෙව්නි ලැහැස්ති වී සිටි නිසා අපි ඉක්මනින් ම නගරය වෙත ගියෙමු.

"කවී මට මේ ඇඳුම මැච් වෙනවද?" දෙව්නි එසේ ඇසුවේ ඉතා අලංකාර ගවුමක් සුරතේ තබා ගෙන ය.

 වාව් ඉට්ස් රියලී නයිස්. ඔයාට ඒක හොඳට ගැලපෙනවා.

එහෙනම් මම මේක ගන්නවා. ඔයා ඇඳුම් අරගෙන ඉවරද කවී.

"ඔව් මම අරගෙන ඉවරයි. අපි මොනවා හරි කන්න යමුද? මට බඩගිනියි." මා පැවසුවේ විශාල කුසගින්නකින් පෙලෙමිනි.

ඕකේ, ලෙට්ස් ගෝ

***

 අපි ඇඳුම් මලු ද අනෙකුත් බඩු ද රැගෙන ආහාර ගැනීමට සුදුසු ස්ථනයක් සොයා ඇවිද ගියෙමු. ඉතාමත් ඉක්මනින් රුසියාවේ තිබෙන ප්‍රණීත ම ආහාර ඇති වීදි වෙලදසැල අසල අපි නතර වුණෙමු. දෙව්නි කෑම රැගෙන එනතුරු මම වාඩි වී සිටියෙමි. ඈත බලා සිටි මම එක වරම දුටු දර්ශනයෙන් කම්පනය වුණෙමි. එය හුදෙක් දැකලා පුරුදු රුවක් නොවීය. ඒ ඔහුය. වේගයෙන් පුටුවෙන් නැගිට ගත් මම ඔහු දුටු ස්ථානයට දිව ගියෙමි. ඒ වන විට එතැන කිසිවෙකු නොවීය. මගේ සිතිවිලි නිසා දෑස ද මට බොරු කලාද? එය මිරිගුවක් බව නම් මගේ මොලය පැවසුවේ නැත.

" කවී ඔයා මොකද මිච්තන කරන්නේ? මම හොදට ම බට වුණා." දෙව්නි පැවසුවේ මා තවත් තිගස්සවමිනි.

"දෙව්.. දෙව් මම දැක්කා එයා මෙතන ඉන්නවා, මො දැක්කා. මට හොදට ම විශ්වාසයි එයා මෙතන හිටියා." මම කලබලයෙන් පැවසුවෙමි.

" කාම් ඩවුන් කවී. මම කියන දේ අහන්නකෝ කව්ද එයා කියන්නේ? " දෙව්නි ඇසුවේ මාව සනසවමිනි.

" දෙව් මම දැක්කා තාත්තා මෙතන ඉන්නවා." මම හඬමින් පැවසුවෙමි.

" ඉට්ස් ඕකේ බේබි,   අපිට වෙලාවකට ඔය වගේ වැඩ වෙනවා කෙනෙක් වගේ චිත්ත රූප මැවිලා පේන එක, ඩෝන්ට් වොරි කවී ලෙට්ස් ගෝටු ද

කැෆේ" දෙව්නි මා සැනසුවේය. දෙව්නිගේ වදන්වලට එකග වෙනවා හැරෙන්නට මා හට වෙන කරන්නට දෙයක් නොවීය.

කැෆේ එක වෙත ගිය අප දෙදෙනා ආහාර ගෙන නැවතත් බෝඩිම වෙත පැමිණියෙමු.

***

ඒ සුන්දර දිනය උදා විය. වෙනදා මෙන් නොව ඉරත් අද වේලසනින් ම වැඩ අරඹා තිබිණි. වේලාසනින් ම නැගිට ගත් අපි ඉක්මනින් ම ලෑස්ති වුනෙමු.

" දෙව්නි.... අද ඉදලා මගේ හැම හීනයක් ම හැබෑ වෙනවා.. දෙව් ඒ දවස ආවා..." මම කීවේ සතුටින් ඉපිලෙමිනි.

" කවී වැඩිය උඩ පනින්න එපා " දෙව්නි පැවසුවේ මටත් වඩා සතුටිනි.

" ඔකේ ඉට්ස් ටයිම් ටූ ගෝ, ලෙට්ස් ගෝ." මම පැවසුවෙමි.

ඔව් යමු යමු, නැත්තන් පළවෙනි දවසෙම පරක්කු වෙන්න වෙයි.

***

බෝඩිමේ සිට පා ගමනින් යා හැකි දුරක එම රෝහල පිහිටා තිබුණි.

මමත් දෙව්නිත් සතුටින් ඇවිද ගියෙමු.

" බලන්න දෙව්, අද ලස්සන, අපි වෙනුවෙන් ම සරසලා වගේ නේද?' මම ඇසුවේ මහත් වූ සතුටිනි.

"ඇත්තමයි කවී, ඉට්ස් රියලි නයිස්. වේලිච්ච කොල වැටෙනවා. ලොකු හුළඟකුත් එනවා" දෙව්නි ද සතුටින් පැවසුවාය.

අවසානයේ කතාවෙන් කතාව අප දෙදෙනා රෝහල ආසන්නයටම පැමිණියෙමු.

දෙව් අපි කලින් වගේ නේද? ඔව් නේද කවි කමක් නෑ ටිකක් වෙලා ඉමුකෝ අනිත් අය එනකන්.

ටික වේලාවකට පසු අපේ සියලුම මිතුරන් එහි පැමිණියේ ය.

ප්‍රථමයෙන්ම අපව රැස්වීම් ශාලාවට ගෙන්වා. වැඩ කා යුතු ආකාරය පිළිබඳව දැනුවත් කලේය. දෙව්නීත් මමත් එකම අංශයකට වැටීම් දෛවෝපගත සිදුවීමක් විය.

ඉතා සුහද කාය මණ්ඩලයක් එහි සිටි බැවින් අපට මිනිත්තු දෙකක් යන විට එය අපේ ම තැනක් වැනි විය.

උද වරුව ම ශීඝ්‍රගාමීව ගෙවී ගියේ ය. දහවල් කෑම වේලාවේ දී අප සැම සතුටු සාමීච්චි කතා බහක නිරත විය. පලමු දිනය සාමකාමීව ගෙවී ගියේ කිසිදු රෝගියෙකු මිය නොගිය නිසාත්, හදිසි මරණාසන්න රෝගියෙකු අද දිනයේ නොපැමිණි නිසාත් ය.

රෝහල් කාය මණ්ඩලය ඇතුලු අනෙකුත් වෛද්‍යවරුන් පැවසුවේ එය අපගේ වාසනාව නිසා සිදු වූ දෙයක් බවයි.

කෙමෙන් කෙමෙන් ඒ වාසනාවන්ත දිනයේ අවසානය කරා අප ළඟා වීමු.

සියල්ල අවසන් කර අප දෙදෙනා බෝඩිම වෙත පැමිනියෙමු.

***

හෙට දිනයේ දී කැම්පස් යෑමට තිබූ බැවින් මමත් දෙව්නිත් බඩු ලෑස්ති කර ගතිමු.

වේලාසනින් කෑම කෑ අපි. වෙහෙසකර නමුත් ඉතාමත් හොඳ දිනයක අවසානය සනිටුහන් කලෙමු.

***

පසුදින උදෑසන ම අපි කැම්පස් එකට ගියෙමු. සුපුරුදු පරිදි දිනය කිසිදු හැල හැප්පීමකින් තොරව ගලා ගෙන ගියේ ය. නමුදු ඒ වැඩි වේලවකට නම් නොවීය. දේශනයක් පවත්වමින් තිබූ වේලාවක් අතරමැද නිවේදනයක් ගියේ ය. එහි සඳහන් තොරතුර නම් ජෙ බෝඩිම පිහිටා තිබෙන නගරයේ බෝම්බයක් පිපිරී ඇති බවයි. තවද ඒ ආසන්නයේ පිහිටි සැම රෝහලකට ම අප සිසුන් සේවය සඳහා යොදවන බවත් ය.

"දෙව්නි මොකක් ද මේ වෙලා තියෙන්නේ?" මම ඉතා කලබලයෙන් ඇසුවෙමි.

"අනේ මන් දන්නෑ කවී අපි  ආවට පස්සේ මෙහෙම දෙයක් අහපු පළවෙනි වතාව"  දෙව්නි ද කලබලයෙන් පැවසුවා ය.දැන් ඉතින් ඉක්මනට බෝඩින් එකට ගිහිල්ලා  ලෑස්ති වෙලා හොස්පිටල් එකට යමු. දෙව්මි ද මම ද  ඉතා ඉක්මනින්ම බෝඩිම වෙත පැමින ලෑස්ති වී රෝහල වෙත ගියෙමු.   අප  එහි යන විටද  බොහෝ රෝගීන් ප්‍රමානයක් එහි රැගෙන විත් තිබුණි. ඉක්මනින් වෛද්‍යවරුන් වෙත ගිය අපි ඔවුනට සහය වීමු.

බෝහෝ රෝගීන් කිසිදු ප්‍රතිකාරයක් නොලබා ම එම ස්ථනයේම මිය ගොස් තිබුණි.  අපට හැකි අයුරින් සියලු ම රෝගීන්ගේ ජීවිත බේරා ගැනීමට අපි වෙහෙස වී කටයුතු කලෙමු. සුලු තුවාල ලැබූවන් ානෙක් අයට උදව් විය. කාත් කවුරුවත් නොමැති විදේශිකයන්ට ද සහය වීමට තරම් පිරිසිදු සිතක් ඔවුන් සතු විය. එක්වර මෙතරම් පිරිස මගේ දෑස් ඉදිරිපිට දී ම මිය ගිය ප්‍රථම අවස්ථාව මෙය විය. එයින් මා දැඩි කම්පනයකට පත්ව සිටියෙමි. හැකි සෑම රෝගියෙකු ම බේරා ගැනීමට අප උත්සාහ දැරීය. ඉතා අපහසුවෙන් ගෙවා ගත් ඒ දින දෙකදී ම අප රෝහලේ ම නවාතැන් ගතිමු. විශාල රෝගීන් සංඛ්‍යාවක් මිය ගියද රෝහල රැගෙන ඒමට පෙර මිය ගොස් නොතිබූ විශාල පිරිසකගේ ජීවිත බේරා ගැනීමට අපට හැකි විය.

මේ දින දෙකට පසු දින අපට නිවාඩි දිනයක් විය. එදින ද මනස එක තැනක තබා ගෙන සිටීමට  අපට නොහැකි වූ බැවින් ටික වේලවක් විවේක ගත් අපි දහවල් එකට පමණ නැවතත් රෝහල වෙත ගියෙමු.

***

එහිදී දෙව්නී එක් වාට්ටුවකටත් මා වෙනත් වාට්ටුවකටත් සේවයට වැටුණි. ලෙඩුන්ගේ සුව දුක් විමසා තත්වය පරීක්ෂා කර අවශ්‍ය බෙහෙත් නියම කිරීම අපගේ රාජකාරිය විය. ප්‍රථමයෙන් ම මා හට හමු වූයේ කාන්තාවක් ය. ඇය ඉන්දියානු ජාතික කාන්තාවක්

විය. ඇය ඇගේ පවුලේ අයද සමග මෙහි පදිංච්ව සිටියා ය. ඇය පැවසුවේ බෝම්බය පිපිරෙන අවස්තාවේදී ඇය පමණක් එතැන සිටි බවයි. ඇයට අවශ්‍ය බෙහෙත් ද ලියා දී මම මීලග රෝගියා ලගට ගියෙමි.

දෙවියනේ මම මේ දකින්නේ හීනයක් ද ? මට එක් වරම හීල්ලිනි තාත්තේ මම එම ඇඳේ සිටි රෝගියාව බදා ගතිමි. මගේ ඒ කෑ ගැසීමට කලබල වූ

පිරිස මා දෙස ඇස් දල්වා බලා සිටින්නට විය.

නැගිට ගත් මම ඔහු දෙස බැලුවෙමි. තද කලු පැහැති ඇස් දෙකත් උස හැඩි දැඩි සිරුරත්, ඇවිස්සුනු කොණ්ඩයත් ඒ ඔහුම විය.

මගේ කෑගැසීමෙන් කම්පනයට පත්ව සිටි ඔහු ද මා දෙස එක එල්ලේ බලා සිටින්නට විය. එක් වරම ඒ දෑස් කඳුලින් තෙත් විය. "දෝණී මේ ඔයාද පැටියෝ..." ඔහු ඇසුවේ නැගිටින්නට උත්සහ දරමිනි. ඔහුගේ නිකට අසල සුලු තුවාලයකුත් අතට වුනු තුවාලයත් ඇරුනු කොට වෙනත් තුවාල කිසිවක් පෙනීමට නොතිබුනේ ය.

එසැනින් ම මම කෝප ගැන් වූ මුහුණක් ආරූඪ කර ගතිමි. "ඔයා මෙච්චර කල් කොහෙද හිටියේ අපි කොච්චර බය උනාද ඔයා ගැන?" මම තරහින් ඇසුවෙමි.

" බේබි මම ඒ ඔක්කොම දේවල් ඔයාට පස්සේ කියන්නම් , මුලින් ම මට කියන්නකෝ අම්මි එහෙම කොහෙද කියලා, තව ආච්චි අම්මාත්.." ඔහු ලයාන්විතව පැවසුවේය.

එවිට ම වාගේ, " අන්කල් ඔයා" යැයි පවසමින් වේගයෙන් දිව පැමිනි දෙව්නි තාත්තාව බදා ගත්තා ය. " මේ කෙල්ලෝ ඔක්කොම ලොකු වෙලා නේ " යැයි පවසමින් තාත්තා ද සිනාසුනේය.

"අන්කල් එදා කවී මට කිව්වා අන්කල්ව දැක්කා කියලා ඒත් මම විශ්වාස කලේ නෑ අන්කල් , සොරි කවී අයිම් රියලි සොරි." දෙව්නි පසුතැවීමකින් පැවසුවාය.

ඉට්ස් ඕකේ දෙව්. ඉන්නකෝ මම අම්මිවයි, ආච්චි අම්මාවයි පුදුම කරන්නඑසේ පැවසූ මම අම්මාට කෝල් එකක් ගතිමි. එතැන් පටන් සිදු වූ සිදුවීම් කඳුලු අතරින් ගලා ගෙන ගියේ ය. තාත්තාව දුටු විගස අම්මා ඇමතුම විසන්ධි කලා ය. ඉන් මිනිත්තුවකට පසු ඇය නැවතත් ඇමතුමක් ගත්තා ය. ඇගේත් ආච්චි අම්මාගේත් කඳුලු මැදින් ඇමතුම පැය බාගයක් තරම් දිගට ඇදී ගියේ ය. එම මොහොතේදීත් තාත්තා නිදහසට කරුනු කීම කල් දැමීය.

කෙසේ හෝ ගෙවී ගිය ඒ කාලයෙන් අනතුරුව අපි තාත්තාවද රැගෙන බෝඩිම වෙත් ගියෙමු. එහිදී සූරියබණ්ඩාර දෙපල තාත්තාව හොඳින් රැක

බලා ගත්තේ ය .

කාලය ද වේගයෙන් ගෙවී ගියේ ය. මගේ විශ්වවිද්‍යාල ගමන සම්පූර්ණ විය. එබැවින් අපි නැවත ලංකාවට ඒමට කටයුතු සූදානම් කලෙමු.

වසර හතරක කාලයක් නිවහන වූ බෝඩිමත් ඉතා ගුණ යහපත් අසල්වැසියන් වූ සූරියබණ්ඩාර දෙපලත් මෙතරම් කාලයක් සුහදව කටයුතු කල මිතුරනුත් දමා ඒම හද පත්ලට ම දුකක් ගෙන දෙන කාරනයක් වුවද වසර හතරකින් නොදුටු අම්මාත් ආච්චි අම්මාත් දැකීමට යාමට හැකි වීම සතුට ගෙන දෙන කරුණක් විය. කෙමෙන් කාලය ගෙවී යද්දි අප ලංකාවට යන දිනය ද උදා විය. කඳුලු බර දෙනෙතකින් සියල්ලන්ගෙන් සමු ගත් අපි ගුවන්තොටුපල වෙත පැමිණියෙමු. එහිදී අප හා යැමට සූරියබණ්ඩාර දෙපල ද එකතු විය. ඔවුන්ගෙන්ද සමු ගත් අපි ගුවන් යානයට පිවිස ශ්‍රී ලංකාව බලා ගියෙමු. අපව පිළිගැනීමට අම්මාත් ආච්චි අම්මාත් පැමිණි සිටියහ. තාත්තාව දුටු විගස අම්මා හඩමින් විත් ඔහුව බදා ගත්තාය. ඉන් අනතුරුව අපි දියතලාවේ පිහිටි අපගේ නිවස වෙත ගියෙමු. සතුටු සාමීචි කතා බහෙන් අනතුරුව තාත්තා ඔහු අතුරුදහන් වීමට හේතුව කීමට පටන් ගත්තේ ය.

***

ඔහු රුසියාවට ගිය දිනයට දින කිහිපයකට පසු ඔහු ඇතුළු කණ්ඩායම විරුද්ධ කණ්ඩායම විසින් පැහැර ගෙන ගොස් වසර දෙකක් පමණ සිර කොට තබා ගත් බව ඔහු පැවසුවේ ය. ඉන් අනතුරු කෙසේ හෝ ඔහුත තවත් පිරිසක් සමග බේරී පැමිණි බවත් ඉන් අනතුරුව අප කිසිවෙකුගේ තොරතුරක් සොයා ගත නොහැකි වූ හෙයින් ශ්‍රී ලංකාවට පැමිණීමට මුදල් සොයා ගැනීමට ඔහු රැකියාවක නිරත වෙමින් සිටින විට මෙම අනතුරට මුහුණ දුන් බවත් පැවසුවේ ය.

***

එතැන් පටන් නැවතත් මගේ ජීවිතයේ ස්වර්ණමය යුගය උදා විය.

එදින පටන් අපගේ දෙනෙතින් සෑම විටක ම ගිලිහුනු කඳුලු කැට සතුටු කඳුලු පමණක් ම විය.

..........................................................................

සමාප්තයි.

## ***බලාපොරොත්තු***

බලාපොරොත්තු කියන්නේ අපිව ජීවත් කරන දෙයක්. කිසිම දිනක කිසිම හේතුවකට ඔයාගේ බලාපොරොත්තු අත අරින්න එපා. සමහර බලාපොරොත්තු කිසිම දිනක අත අරින්න එපා. ඒවා ඉශ්ඨ කර ගන්නකන් නවතින්නත් එපා. ඔයාගේ බලාපොරොත්තුවලට සුභ පැතුම්.

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මානකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරනයට යොමු කරන ක්‍රියාමූලික පයේශන ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර  හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බීජ දලු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගනනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමව්පියන් සහ ආදිශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය .

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත්  උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්තකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේශනාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොලනගා දී තිබේ තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.